දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No.

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No.: ED/3/37/9/31

දිනය / திகதி / Date: 2006-11 24

චක්‍රලේඛ අංක : 2006/43

සියලුම පළාත් සහ ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ජාතික පාසල් අධ්‍යක්ෂ
සියලුම පළාත් සහ ප්‍රධාන ලේකම්වරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ
සියලුම විදුහල්පතිවරුන් වෙත.

**දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා ගුරුවරුන් බෙදාහැරීම දිරිගැන්වීම පිණිස මූල්‍යමය දිරිදීමනාවක් ලබාදීම සඳහා පාසල් දුෂ්කර සහ අතිදුෂ්කර ලෙස වර්ග කිරීම**

දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා ගුරුවරුන් එම ප්‍රදේශවල රඳවා තැබීම පිණිස එම පාසල්වල විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට මූල්‍ය දිරිගැන්වීමක් ලබාදීම සඳහා පාසල් දුෂ්කර හා අතිදුෂ්කර ලෙස වර්ග කිරීම පිණිස පහත දැක්වෙන විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ.

1. 2005/01 අංක දරණ 2005-01.18 දිනැති චක්‍රලේඛයේ සඳහන් වන පහසුකම් පාදක පාසල් වර්ගීකරණය යන්න ඔබගේ පළාතේ පාසල් <u>සැලසුම්කරණ ප්‍රවේශයක් ලෙසට</u> පාසල් වර්ග කර ගැනීමට තවදුරටත් දායක කර ගත යුතු වුවත්, එම චක්‍රලේඛයේ සඳහන් නිර්ණායක මත පදනම්ව දුෂ්කර හා අතිදුෂ්කර ලෙස වර්ගීකරණයට යටත්ව ඇති පාසල් එම් වර්ග යටතේ සැලකිය යුත්තේ පාසලට පහසුකම් සැපයීමේ සැලසුම් සකස් කිරීමේ ක්‍රියාව සඳහා දර්ශකයක් ලෙස පමණි.

ii. දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා ගුරුවරුන් බෙදාහැරීම, දිරිගැන්වීම පිණිස මූල්‍යමය දිරිදීමනාවක් ලබාදීම පිණිස පාසල්, දුෂ්කර හා අතිදුෂ්කර පාසල් ලෙසට වර්ග කිරීම සිදුකළ යුත්තේ මෙහි දැක්වෙන උපරිම පාසල් සංඛ්‍යාවේ සීමාව තුළ ඔබගේ පළාතට සුවිශේෂ වූ ප්‍රායෝගික තත්ත්වය මත සකස් කර ගනු ලැබූ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත කරණු ලැබූ ප්‍රාදේශීය නිර්ණායක භාවිතා කරමින්ය.

| පළාත | පාසල් වර්ගය වෙනුවෙන් වෙන් වන උපරිම ප්‍රතිශතය | |
|---|---|---|
| | අතිදුෂ්කර පාසල් ප්‍රතිශතය (මුළු පාසල් සංඛ්‍යාවෙන්) (% ) | දුෂ්කර පාසල් ප්‍රතිශතය (මුළු පාසල් සංඛ්‍යාවෙන් ) (% ) |
| උතුරු නැගෙනහිර | 38 | 14 |
| මධ්‍යම | 07 | 17 |
| සබරගමුව | 04 | 25 |
| උතුරුමැද | 24 | 27 |
| වයඹ | 13 | 23 |
| ඌව | 08 | 15 |
| බස්නාහිර | 05 | 04 |
| දකුණ | 05 | 14 |

iii. ඉහත (ii) සඳහන් පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතියලත් ප්‍රාදේශීය නිර්ණායක අනුව උපරිම පාසල් සීමාව තුළ ඔබගේ පලාතේ දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වර්ග කොට එම පාසල් ලේඛණ හා නිර්ණායක ලැයිස්තු දැනගැනීම සඳහා මා වෙත ලැබෙන්නට සළස්වන්න.

(සටහන

මේ අනුව පාසල් සඳහා පහසුකම් සැපයීමේ සැලසුම් ක්‍රියාවලියේදී 2005/01 චක්‍රලේඛයේ නිර්ණායක මත දුෂ්කර හා අතිදුෂ්කර වශයෙන් හඳුනාගැනෙන පාසල් සමූහයකුත්, මූල්‍ය දිරිදීමනාව ගෙවීමේදී ඊට අදාළ ප්‍රාදේශීය නිර්නායක හා උපරිම සීමා අනුව වර්ගීකරණයට ලක්වූ දුෂ්කර පාසල් සහ අතිදුෂ්කර පාසල් වශයෙන් හඳුනාගෙන වෙනත් පාසල් සමූහයකුත් වශයෙන් අරමුණු 2 ක් පාදකව එකිනෙකට වෙනස් වර්ගීකරණ 2 ක් පවතින බව සැලකිය යුතුය.)

ආර්යරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

[Amitha]D:\PPM 2\Director\Difficult School.doc